# ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

## අයදුම්පත් කැඳවීම

## උපකුලපති තනතුර

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින්, 1978 අංක 16 දරන පනතේ 34 වන වගන්තිය හා පසුව සිදු කරන ලද සංශෝධනයන්ට සහ කොමිෂන් සභා චක්‍රලේඛ 03/2023 නියමයන්ට අනුකූල ව ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ උපකුලපති ධුරය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

1978 අංක 16 විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන අනුව උපකුලපතිවරයා විශ්වවිද්‍යාලයේ පූර්ණ කාලීන නිලධාරියෙකි. ඔහු/ඇය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධාරි, ප්‍රධාන අධ්‍යයන නිලධාරි සහ ගණන් දීමේ නිලධාරියා වේ. එමෙන් ම පාලක සභාව සහ සනාථන සභාව යන ආයතන දෙකෙහි ම නිල බලයෙන් පත්වන සභාපතිවරයා ද වේ.

විශ්වවිද්‍යාල පනතේ 1978 අංක 16 වන සංශෝධනය පරිදි උපකුලපතිවරයා ඔහුට/ඇයට නියමිත කාලයට පෙර ධුරයෙන් ඉවත් වීමක් හෝ ඉවත් කරනු ලැබුවහොත් හැරෙන්නට වසර තුනක කාලයක් සඳහා ඔහු/ඇය ඔහුගේ/ඇයගේ හැටපස් වන වයස සම්පූර්ණ වන තුරු ධුරය දරයි. අධ්‍යයන නායකත්වය සැපයීම, කළමනාකරණ ප්‍රතිපත්ති සම්පාදනය ,හඳුන්වාදීම සහ මෙහෙය වීම, පාලක සභාව ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම ඇතුළු විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය පරිපාලනය සඳහා උපකුලපතිවරයා වගකිව යුතු බැවින් අධ්‍යයන විශිෂ්ටත්වය, විනිවිදභාවය, වගවීම, ප්‍රජාතන්ත්‍රවාදී කළමනාකරණය, ඵලදායී හා පක්ෂග්‍රාහී නොවන නායකත්වය යන මූලධර්ම ඔහු/ඇය සතු විය යුතුය.

අදාළ අපේක්ෂකයා/අපේක්ෂිකාව ඉහළ මට්ටමේ පර්යේෂණ ධාරිතාවක්, නායකත්ව හැකියා, අන්තර් පුද්ගල සම්බන්ධතා, ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳ නිවැරදි අවබෝධයක් සහ තීරණ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට කැපවීම ඇතුළු උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ජයග්‍රාහී ඉතිහාසයක් ඇත්තෙකු විය යුතු ය. සාරධර්ම හා විශ්වවිද්‍යාලයේ මෙහෙවර පිළිබඳ මනා අවබෝධයක් මෙන්ම ප්‍රජාව සඳහා කැපවීම ද ඔහු/ඇය සතුව පැවතිය යුතු ය.(වැඩි විස්තර සඳහා විශ්වවිද්‍යාල වෙබ් අඩවිය : https://sab.ac.lk/ වෙත පිවිසිය හැකි ය.)

උපකුලපතිවරයා ඉහළම අධ්‍යයන වැටුප් පරිමාණයට සුදුසුකම් ලබා ඇති අතර වැටුපෙන් 15% ක සංග්‍රහ දීමනාවක් සහ තනතුරට අදාළ අනෙකුත් දීමනා සඳහා හිමිකම් ලබනු ඇත.

පත්කිරීමේ ක්‍රියා පටිපාටිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 2023 අප්‍රේල් 10 දිනැති 03/2023 කොමිෂන් සභා චක්‍රලේකය පහත වෙබ් අඩවිය වෙත පිවිස ලබා ගත හැකිය. https://ugc.ac.lk/attachments/2442_Commission%20Circular%20No.%2003-2023.pdf

අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතු ය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 63 ට නොවැඩි විය යුතු ය.

අයදුම්පත් සමග පහත ලියකියවිලි අමුණා එවිය යුතු ය.

(i) අයදුම්කරුගේ සම්පූර්ණ කරන ලද ජීවදත්ත පත්‍රිකාවක්.

(ii) විශ්වවිද්‍යාලයේ දැක්ම පිළිබඳ පෞද්ගලික ප්‍රකාශයක් සහ උපකුලපති තනතුරට පත් කරනු ලැබුවහොත් ඔහු / ඇය සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරන දේ පිළිබඳ කෙටි විස්තරයක්.

(iii)වත්මන් උපකුලපතිවරයා අයදුම්කරුවෙකු හෝ මීට පෙර විශ්වවිද්‍යාලයේ උපකුලපති ධුරය හෙබ වූයේ නම්, ඔහුගේ / ඇයගේ කාර්යාලයේ පළමු කාල සීමාව තුළ දී සිදුකරන ලද ජයග්‍රහණ ඉස්මතු කෙරෙන වාර්තාවක් ඉහත (i), (ii) වගන්තියේ සඳහන් කර ඇති ලේඛනවලට අමතර ව ලබා දිය යුතු ය.

(iv)ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය හැර අනෙකුත් සේවා, සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවය කරන අයදුම්කරුවෙකු අයදුම්පත් ඉදිරිපත් කරන ලද අයෙකු නම්, ඔහු / ඇය උක්ත තනතුරට පත් කරන අවස්ථාවේදි නිදහස් කළ හැකි ද යන්න සඳහන් කෙරෙන සේවා යෝජකගේ ලිපියක්.

උපකුලපති ධුරය සඳහා ඉල්ලුම් කළ අපේක්ෂකයින් විශේෂ පාලක සභා සැසිවාරයක් ඉදිරියේ සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතු අතර අවම වශයෙන් විනාඩි දහයක (10) කට නො අඩු නමුත් විනාඩි (15) නො වැඩි කාල සීමාවක් තුළ කෙටි ඉදිරිපත් කිරීමක් සිදු කළ යුතු ය. යම්කිසි සුවිශේෂී තත්වයක් තුළ, කිසියම් අපේක්ෂකයෙකුට  විශේෂ පාලක සභා රැස්වීමට පෙනී සිටීමට හැකියාවක් නොමැති අවස්ථාවක ලේකම්වරයා වෙත කෙරෙන පූර්ව දැනුම් දීමකින් පසු, ඔහුට / ඇයට අතථ්‍ය මාදිලිය (Virtual Mode ) මගින් පෙනී සිටීමට අවසරය ලැබේ.

ඉහත පරිදි අදාළ ලියකියවිලි සහිත අයදුම්පත් ලේඛකාධිකාරි, ලේඛකාධිකාරී කාර්යාලය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, තැ. පෙ. අංක 02, බෙලිහුල්ඔය යන ලිපිනයට **12.05.2026** දින සවස 3.00 ට හෝ ඊට පෙර ලියාපදිංචි තැපැලෙන් /කුරියර් මාර්ගයෙන් හෝ පැමිණ භාර දිය යුතුය. ඊට අමතර ව අදාළ උපකාරක ලේඛන ද සහිත මෘදු පිටපතක් **PDF** ආකෘතියෙන් යුක්ත ව registrar@sab.ac.lk ලිපිනයට ඊමේල් (Email) කළ යුතු ය.

අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත අඩංගු ලියුම් කවරයෙහි ඉහළ වම් කෙළවරේ **"උපකුලපති තනතුර සඳහා අයදුම්පත්‍රය"** ලෙස සඳහන් කළ යුතුය.

ලේඛකාධිකාරි හා පාලක සභා ලේකම්
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
09.04.2026